**නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන (ප්‍රදාන) - 2020**

-----------------------------------------------------------------

නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ (ප්‍රදාන) 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2018 මැයි 11 දින එළඹි අංක 9193 එස්ආර්අයි (ඊඑෆ්) දරන ප්‍රදාන ගිවිසුමේ iv ව්‍යවස්ථාවේ 4.02(අ) වගන්තියේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා වැඩසටහන් කාලය

-----------------------------------------------------------------------------------

ප්‍රදාන ගිවිසුමට අනුව , එවකට නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය එනම් වත්මන් අධ්‍යාපන අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර අනෙකුත් ආයතන 10 ක් වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. (අ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු අංශය වෙත පෞද්ගලික අංශයේ දායකත්වය වැඩි කිරීම (ආ) ස්වයං රැකියාවන් සඳහා කාන්තාවන් ඉලක්ක කර ගත් ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් වැඩි දියුණු කිරීම (ඇ) සාම්ප්‍රදායික නොවන අංශ වෙත කාන්තාවන් ආකර්ශනය කර ගැනීම සඳහා ඉලක්කගත දිරිගැන්වීම්, උපදේශනය සහ රැකියා මත පුහුණුව ලබා දීම සහ (ඈ) පෞද්ගලික අංශය තුළ ස්ත්‍රී පුරුෂ බඳවා ගැනීම් හා වැඩ කළ හැකි පරිසරයක් නිර්මාණය කිරීම වැඩසටහනේ අරමුණු වේ. ප්‍රදාන ගිවිසුම ප්‍රකාරව වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 534 කට සමාන එජඩො මිලියන 3 ක් වූ අතර දරිද්‍රතාවය අවම කිරීම සඳහා වන ජපන් අරමුදල විසින් ප්‍රදානයක් ලෙස ලබා දීමට අපේක්ෂිත වන අතර ආසියානු සංවර්ධන බැංකුව විසින් එහි පරිපාලන කටයුතු සිදු කරනු ලබයි. වැඩසටහන එහි කටයුතු 2018 වර්ෂයේ නොවැම්බර් 16 ආරම්භ කරන ලද අතර 2021 මාර්තු 31 වනවිට නිම කිරීමට නියමිතය.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මගේ වාර්තාවේ 2.1 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනෙහි (ප්‍රදාන) මූල්‍ය ප්‍රකාශනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව වැඩසටහනේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

-------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

--------------------------------------------------------------------------------------------------

මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණුස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයක් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහන මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විමට ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් ඇති විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින්, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සමස්ත ඉදිරිපත් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම. හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව වගකීම් දරන්නන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

| ගිණුම්කරණ අඩුපාඩුව | වටිනාකම රු. | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| -------------------------- | ------------- | ------------------ | --------------- |
| මූල්‍ය ප්‍රතිපත්ති අංක 4.1 ට අනුව, මූල්‍ය ප්‍රකාශයන උපචිත පදනම මත පිළියෙළ කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු රු. 717,500 ක් මූල්‍ය | 717,500 | සමාලෝචිත වර්ෂයට අදාළ වියදමට එකතු කිරීම සඳහා 2020 වර්ෂය තුළදී රු .717,500 ක ඉන්වොයිසි ලැබී | වරද නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| ප්‍රකාශනයට ඇතුලත් කර නොතිබුණි. | නැති බව ඔක්ස්ෆාර්ම් ආයතනය දැනුම් දෙන ලදී. |

**2.2 මුදල් ආපසු ගැනීමේ අයදුම්පත් ප්‍රමාදයන්**

| අංකය | ආපසු ලබාගැනීමේ අයදුම්පත් අංකය | කාලපරිච්ඡේදය | ඉදිරිපත් කළ දිනය | ප්‍රමාද වූ දින ගණන | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| i | 01 | 2018 දෙසැම්බර් සිට 2019 මාර්තු | 2019 අගෝස්තු 02 | දින 124 | සටහන් කර ඇත. නියමිත වේලාවට ඉදිරිපත් කරන ලෙස ක්‍රියාත්මක කරන ආයතනයට ඉල්ලීමක් කර තිබුණි. කෙසේ වෙතත්, එම කාලය තුළ පැවති නොවැළැක්විය හැකි තත්වයන් නිසා ඒවා නියමිත වේලාවට ප්‍රතිපූර්ණය කිරීමට නොහැකි විය. | මුදල් ආපසු ගැනීමේ අයදුම්පත් නියමිත වේලාවට ඉදිරිපත් කිරීමට කළමනාකරණය අවශ්‍ය පියවර ගත යුතුය. |
| ii | 02 | 2019 අප්‍රේල් සිට 2019 ජූලි | 2019 දෙසැම්බර් 24 | දින 146 | | |
| iii | 03 | 2019 අගෝස්තු සිට 2019 දෙසැම්බර් | 2020 මාර්තු 02 | දින 9 | | |
| iv | 04 | 2020 ජනවාරි සිට 2020 අප්‍රේල් | 2020 ඔක්තෝබර් 05 | දින 158 | | |
| v | 05 | 2020 මාර්තු සිට 2020 ජූලි | 2021 පෙබරවාරි 22 | දින 200 | | |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේදී, පාඨමාලා 226 ක් සඳහා මුළු පුහුණුලාභීන් 6524 ක් පුහුණුව සඳහා බඳවාගෙන තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේදී පුහුණුලාභීන් 309 ක සහභාගීත්වයෙන් පාඨමාලා 11 ක් පවත්වා තිබුණි. කේසේ වුවද 5 දෙනෙකු පුහුණුව හැරගොස් තිබුණි. | 2019 සහ 2020 වර්ෂ සඳහා වූ පුහුණු වැඩ සටහන් එකිනෙකට වෙනස් හා ඍජු ලෙස සංසන්දනය නොහැක.එය ව්‍යාසායකත්ව පුහුණුවක් පමණක් වන අතර 2020 සමස්ත ශිෂ්‍ය ජනගහනය ලෙස පාඨමාලා 266 ක් යටතේ සියළුම ආයතන විසින් පවත්වනු ලබන පාඨමාලා වල ඇතුලත් ශිෂ්‍ය ජනග්‍රහණය සලකණු ලැබේ. | වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා පුහුණු කටයුතු සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා කළමනාකාරීත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ව්‍යාපෘතියේ 2019 අප්‍රේල් 09 දිනැති ආරම්භක වාර්තාව අනුව මූලිකව පළාත් 05 ක, එනම් බස්නාහිර , උතුරු, වයඹ, ඌව හා සබරගමුව යන පළාත් 05 තුළ ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ පවත්වා තිබූ පුහුණු වැඩසටහන් වයඹ හා උතුර යන පළාත් දෙකට පමණක් සීමා වී තිබුණි. | දරිද්‍රතා සාක්කු සමීක්ෂණය බස්නාහිර පළාතේ 2020 ජුනි සිට ජූලි දක්වා කාලය තුළ සිදු කරන ලදී. (කොවිඩ් අගුලු දැමීමේ කාලය). 2020 නොවැම්බර් 20 වන දින බස්නාහිර පළාතේ දරිද්‍රතා සාක්කු සඳහා එස්එස්ඩීපී අනුමැතිය ලැබුණි. එබැවින් බස්නාහිර පළාත් ක්‍රියාකාරකම් ආරම්භ කළේ 2021 පළමු දින සිට ය.<br>ඌව සහ සබරගමුව සම්බන්ධීකාරක 2020 ජුනි මාසයේදී ඉල්ලා අස් වූ අතර 2020 ඔක්තෝම්බර් මාසයේදී නව බඳවා ගැනීම් සිදු කරන ලදී. ඔහු සම්බන්ධ වූ පසු කොවිඩ් දෙවන රැල්ල ආරම්භ වූ අතර පුහුණුවීම් කිරීමට නොහැකි විය. තනතුර පුරප්පාඩු වූ කාලය තුළ ව්‍යාපෘතිය මඟින් එම පළාත් දෙක තුළ වැඩසටහන ක්‍රියාත්මක කර නොමැත. මෙම කාල සීමාව තුළ ජාතික මට්ටමේ වැඩසටහන් කාර්ය මණ්ඩලයක් ද නොවිය. | අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතියේ 2018 – 2020 විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘතිය විසින් නියමිත කාලසීමා තුළ ළඟාකරගත යුතු වූ ප්‍රධාන ඉලක්කගත කාර්යයන් 24 ක් හා එම ප්‍රධාන ඉලක්කගත කාර්යයන් යටතේ වූ උප ඉලක්කගත කාර්යයන් 110 ක් ද හඳුනාගෙන තිබූ අතර, මෙම ඉලක්ක අතරින් ප්‍රධාන ඉලක්ක 17 ක් යටතේ වූ උප ඉලක්ක 48 ක් අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වී නොතිබුණි. | පහත සඳහන් රට තුළ පැවතුන නොවැලැක්විය හැකි වාතාවරණයන් යටතේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අයහපත් ලෙස බලපා ඇත.<br><br>ව්‍යාපෘති ක්‍රියාකාරී සැලැස්ම 2019 ජුනි මාසයේදී අවසන් කර අනුමැතිය ලබා ගන්නා ලදී,<br>පාස්කු ප්‍රහාරය 2019 අප්‍රේල් 21 දින සිදුවීම,<br>කොවිඩ් වසංගතය 2020 මාර්තු මාසයේදී ආරම්භවීම,<br>කාර්ය මණ්ඩල පිරිවැටුම,<br>වැඩසටහන් කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ ගැටළු,<br>කොවිඩ් දෙවන රැල්ල 2020 ඔක්තෝම්බර් මාසයේදී ආරම්භ වූ අතර එය 2020 දෙසැම්බර් දක්වා විය. | අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ලියවිල්ලෙහි ඡේද අංක 20 ප්‍රකාරව, ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබාදෙන ප්‍රතිපාදනයන් ගිණුම්ගත කිරීම සඳහාත් එම ප්‍රතිපාදනයන් මත කරන මූල්‍ය ගනුදෙනු ගිණුම් තැබීම සඳහාත් වෙනම බැංකු ගිණුමක් පවත්වාගත යුතු බවට විධිවිධාන දක්වා ඇති අතර 2019 මැයි 13 පැවති මූල්‍ය රැස්වීමේදී ද මාසික බැංකු සැසඳුම් වාර්තා ව්‍යාපෘති කාර්යාලයට ඉදිරිපත් කළ යුතු බවට උපදෙස් ලබාදී තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතිය 2018 නොවැම්බර් 16 දින සිට ක්‍රියාත්මක කර තිබුණද උපදේශන ආයතනය විසින් ව්‍යාපෘතිය සඳහා වෙනම බැංකු ගිණුමක් ආරම්භ කර බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර තිබුණේ 2020 ඔක්තෝබර් මස සිටය. එමෙන්ම එම බැංකු ගිණුම තුළින් එකතුව රු. 140,671 ක් වූ ව්‍යාපෘති උපදේශන ආයතනයේ වියදම්ද දරා තිබුණි. | ජ්ලැන් ඉන්ටර්නැෂනල් ආයතනය 2020 පෙබරවාරි සිට වෙනම බැංකු ගිණුමක් භාවිතා කිරීමට පටන් ගෙන තිබේ. ජ්ලැන් ඉන්ටර්නැෂනල් ආයතනය ලංකාවේ කටයුතු වසා දැමූ හෙයින් බැංකු සැසඳුම් වාර්තා එකතු කර ගැනීමට නොහැකි විය.<br>බැංකු ගිණුම් විස්තර පහත පරිදි වේ.<br>ගිණුමේ නම - ෆොස්ටර් ජේරන්ට් ජ්ලැන් ඉන්ටනැෂනල් ගිණුම් අංකය - 01369286802 (රුපියල් )<br>බැංකු නාමය - ස්ටැන්ඩට් චරලත් බැංකුව<br>ඔක්ස්ෆෑම් 2020 ඔක්තෝම්බර් සිට මෙම ව්‍යාපෘතිය සඳහා වෙනම බැංකු ගිණුමක් භාවිතා කරයි. ව්‍යාපෘති හා සම්බන්ධ සියළුම පිරිවැය සහ පරිපාලන පිරිවැය මෙම බැංකු ගිණුම හරහා ගෙවනු ලබයි. රු. 140,671 ක වියදම ව්‍යාපෘතියට සම්බන්ධ පරිපාලන පිරිවැයකි. | වැඩසටහනෙහි මූල්‍ය ගණුදෙණු සඳහා වෙනම බැංකු ගිණුමක් ආරම්භ කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමේ ලියවිලි අනුව, ව්‍යාපෘති කාලසීමාව තුළ සෑම කාර්තුවකටම වරක්, කාර්තුමය ප්‍රගති වාර්තා පිළියෙල කළයුතු වුවත්, අවුරුදු 03 ක් වන මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රගති වාර්තා නියමිත ලෙස ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නැත | වැඩසටහනේ අවශ්‍යතාවයට අනුකූලව කාර්තුමය ප්‍රගති වාර්තා ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතියෙහි ප්‍රගති වාර්තාවට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේදී කිසිඳු කාර්යභාරයක් ඉටුනොකරන ලද සංරවක 11 ක් සඳහා එජඩො 860,059 ක අයවැයගත ප්‍රදාන වෙන්කර තිබුණි. | සටහන් කර ඇත. | අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ව්‍යාපෘතියෙහි ප්‍රගති වාර්තාවට අනුව, සංරචක 23 සඳහා වෙන් කරන ලද අයවැයගත ප්‍රදාන එජඩො 2,253,620 ක් වුවද, සමාලෝචිත ගිණුම් වර්ෂය අවසානයේදී වියදම් කර තිබූ මුදල එජඩො 74,542 කි. | පහත සඳහන් රට තුළ පැවතුන නොවැලැක් විය හැකි වාතාවරණයන් යටතේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අයහපත් ලෙස බලපා ඇත.<br><br>ව්‍යාපෘති ක්‍රියාකාරී සැලැස්ම 2019 ජූනි මාසයේදී අවසන් කර අනුමැතිය ලබා ගන්නා ලදී,<br>පාස්කු ප්‍රහාරය 2019 අප්‍රේල් 21 දින සිදුවීම,<br>කොවිඩ් වසංගතය 2020 මාර්තු මාසයේදී ආරම්භවිම,<br>කාර්ය මණ්ඩල පිරිවැටුම,<br>වැඩසටහන් කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ ගැටළු,<br>කොවිඩ් දෙවන රැල්ල 2020 ඔක්තෝම්බර් මාසයේදී ආරම්භ වූ අතර එය 2020 දෙසැම්බර් දක්වා විය. | අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |

**3.3.මතභේදයට තුඩුදුන් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතියේ පූර්ව උපදේශන ආයතනය වූ ජ්ලැන් ඉන්ටර්නැෂනල් ආයතනය විසින් කර්මාන්ත නිපුණතා අංශය තුළ උපායමාර්ග සංවර්ධනය හා පහසුකම් සඳහා මෙහෙයුම් සැලසුමක් සකස් කිරීම සම්බන්ධව තක්සේරුකරණය සඳහා මිල ගණන් කැඳවා 04 වන අවම මිල වු රු. 3,079,125ක් ඉදිරිපත් කර තිබූ කර්මාන්ත සේවා කාර්යාංශය තෝරාගෙන උපදේශක කාර්යය පිරිනමා තිබුණි. අවම මිල ඉදිරිපත් කර තිබූ ආයතනය සහ ප්‍රසම්පාදනය පිරිනැමූ ආයතනයේ රු. 967,125 ක වෙනසක් විය.කෙසේ නමුත් කර්මාන්ත සේවා කාර්යාංශය තෝරාගැනීමට ප්‍රධාන වශයෙන් තාක්ෂණික ධාරිතාවය, | කර්මාන්ත සේවා කාර්යාංශය තෝරාගෙන ඇත්තේ තරඟකාරී ලංසු තැබීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කිරීමෙන් පසුව සහ සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියකින් සහ තාක්ෂණික කමිටු ඇගයීමෙන් පසුව ය. අදාළ ලියකියවිලි ඉදිරිපත් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

උපදේශක සුදුසුකම් සහ අයවැය පාදක කරගත් බව සඳහන් කර තිබුණද කොන්දේශි වලට යොමුව අනුව තෝරාගත් ආයතනයේ උපදේශකවරුන් වෙත තිබිය යුතු පශ්චාත් උපාධි හා අනෙකුත් සුදුසුකම් සම්බන්ධයෙන්, පරීක්ෂා කිරීමට අදාල තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.